මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුණනලද ඇහැටුගහමුල්ලේවත්තද, (296,003 පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම); නැගෙණහිරට පතිරජමුදියන්සෙලාගේ අප්පුහාමි සහ තවත් අයවළුන් විසින් අයිතිකම්කියන ඇහැටුගහකුඹුරද, සියඹලාගහකුඹුර පිල්ලෑව (ප්‍රවෙනි); දකුණට ආණ්ඩුව විසින් විකුණනලද මැදපිල්ලෑවහේන (306,927 පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම); බස්නාහිරට පතිරජමුදියන්සෙලාගේ කන්දප්පු ආරච්චි විසින් අයිතිකම්කියන මීගහකුඹුරද.

V.—මූල් සිතියම 969.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 20C .. | කීනගහකුඹුරපිල්ලෑව .. .. .. .. | 1 2 14 |

මීට මායිම්—උතුරට උනගහමුලවත්ත, (ප්‍රවෙනි); නැගෙණහිරට සහ දකුණට පතිරජමුදියන්සෙලාගේ කන්දප්පුහාමි ආරච්චි විසින් අයිතිකම්කියන කීනගහකුඹුරද; බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන තාවලපිල්ලෑව, (300,067) පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම.

VI.—මූල් සිතියම 969.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 21D .. | ඇහැටුගහකුඹුරපිල්ලෑව .. .. .. .. | 0 3 32 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුණනලද ඇහැටුගහමුලවත්ත (296,003) පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම; නැගෙණහිරට පතිරජමුදියන්සෙලාගේ හේතුහාමි සහ තවත් අයවලුන් විසින් අයිතිකම්කියන තාවල්ලේකුඹුරද; දකුණට පතිරජමුදියන්සෙලාගේ අප්පුහාමි සහ තවත් අයවලුන් විසින් අයිතිකම්කියන ඇහැටුගහකුඹුරද; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුණනලද ඇහැටුගහමුලවත්ත, (296,003) පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම.

VII.—මූල් සිතියම 969.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 21F .. | තාවල්ලේපිල්ලෑව .. .. .. .. | 0 3 30 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුණනලද කුරුපුගොල්ලේවත්ත, (296,036) පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම; නැගෙණහිරට පතිරජමුදියන්සෙලාගේ කන්දප්පුහාමි ආරච්චි විසින් අයිතිකම්කියන කීනගහකුඹුරද; දකුණට ආණ්ඩුව විසින් විකුණනලද කුරුපුගොල්ලේපිල්ලෑව, (297,744 පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුණනලද කුරුපුගොල්ලේවත්ත, (296,036) පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම.

VIII.—මූල් සිතියම 969.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 24B .. | ගලගාවහේන .. .. .. .. | 1 0 19 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුණනලද ගලගාවහේන, (296,002 පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම); නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණනලද බක්මීගහමුලවත්ත, (306,926 පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් විකුණනලද හක්කොටුවාහේන, (306,926 පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම); දකුණට දික්වෙල ගමේ ගම්ඉමද; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුණනලද කජුගහමුලහේන, (306,916 පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් අයිතිකම්කියන ගලගාවවත්ත.

IX.—මූල් සිතියම 969.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 30 .. | කරදගහමුලපිල්ලෑව .. .. .. .. | 2 1 38 |
| 30C .. | සියඹලාකුඹුරපිල්ලෑව .. .. .. .. | 1 3 5 |
| | | 4 1 3 |

මීට මායිම්—උතුරට සියඹලාගහමුලවත්ත, (ප්‍රවෙනි); නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණනලද මීගහමුලහේන, (300,559 පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් විකුණනලද කජුගහමුලහේන, (306,916 පිඹුරුකරදාසියේ පෙනෙන ඉඩම), දික්වෙල ගමේ ගම්ඉමද; දකුණට කුඹුක්ගහකුඹුරේ ඇලද; බස්නාහිරට සියඹලාගහමුල පිල්ලෑව, (ප්‍රවෙනි) සියඹලාගහකුඹුර පිල්ලෑව, (ප්‍රවෙනි) පතිරජමුදියාන්සෙලාගේ අප්පුහාමි සහ තවත් අයවලුන් විසින් අයිතිකම්කියන ඇහැටුගහකුඹුරද.

[කුරුණෑගල වි. ම. 274—1917.]

[අනුරාධපුර දන්වීම නො. 6,598.]

වර්ෂ 1917ක්වූ ඔක්තෝම්බර් මස 5වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900යේ සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඩී. ජී. විලව් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඩී. ජී. විලව්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

උතුරු මධ්‍යම දිසාවේ නුවරගම් පලාතේ ඉහල කැලේගම්තුලාණේ විලච්චියකෝරලේ නවක්කුලම යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන 673 මුල් සිතියමේ 12Aන් පෙනෙන පර්චස් 34ක් බිම්තරම ඇති සාමාන්‍යවශයෙන් තිස්බම්බේ කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට සහ නැගෙණහිරට හේරත්හාමි වෙල් විදානේ විසින් අයිතිකම්කියන ගන්ගොඩේද ; දකුණට සහ බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන තිස්බඹද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 223වෙනි පිටේ ප්ලෑනය බලනු.

[අනුරාධපුර ඩී. ම. 46—1917.]

---

[අනුරාධපුර දන්වීම නො. 6,599.]

වර්ෂ 1917ක්වූ ඔක්තෝම්බර් මස 5වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඩී. ජී. විලව් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිවාසිකම පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඩී. ජී. විලව්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

උතුරු මධ්‍යම දිසාවේ නුවරගම්පලාතේ විලච්චියකෝරලේ විලච්චියතුලාණේ කුකුල්කටුව, කදුරුපිටිය, වීරසෝලේ, ඇලපත්ගම සහ සූරියදමන යන ගම්වල පිහිටාතිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටිය, එනම් :—

ටොපො මුල් සිතියම 7.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 .. | කෝන්ගහලන්දේමූකලාන, මිනිපිච්චතියලහකැලේ, ගෙදරගාවලුන්ද, කිතුල්වලමූකලාන, පන කවම්බූකැලේ, වරගේනමූකලාන, කදුරුපිටියකැලේ, ගලගොඩලදකැලෙ, ඉලිපත්තවැම්බුවේ කැලේ, පහලවෙලකැලේ, ගොඩවෙලවෙම්බුවකැලේ, ඇලපත්ගාවේකැලේ, සූරියදමනකැලේ සහ අන්දරදිලියකැලේ (පාරවල්, වැව් සහ ඇල) .. .. .. | 24,910 0 16 |

මීට මායිම්—උතුරට තලාවඔයද ; නැගෙණහිරට තලාවඔයද, හැලඹෑව, දුනුමඩවල, සිවලපිටිය සහ ඉටිකුලමගමේ ගම් ඉමවල්ද ; දකුණට නොම්මර 5යේ ටොපො මුල් සිතියමද ; බස්නාහිරට නොම්මර 5යේ ටොපො මුල් සිතියමද, මහවැවඇලද, නොම්මර 1යේ මුල් සිතියමද.

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටි මේ දන්වීමෙන් අත්හැරියවගත් ඒවායේ මුළු බිම්තරම වන අක්කර 139කුත් රූඩ් 3කුත් පර්චස් 24ර ඉහතකී අක්කර 24,910කුත් පර්චස් 16යේ බිම්තරමේ අඩංගු නොවෙන වගත් මෙයින් දැනගත යුතුයි.

ටොපො මුල් සිතියම 7.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| | කුකුල්කටුවගම. | | | |
| A 2 | වරගේනමූකලාන යනාදිය (156,333 පිඹුරු කඩදාසියේ පෙනෙන ඉඩම) .. | 31 | 3 | 32 |
| A 3 | කුකුල්කටුවාවෙල .. .. | 7 | 1 | 19 |
| A 4 | ඇල (දියපාර) .. .. | 0 | 1 | 13 |
| A 5 | අඩිපාර .. .. | 0 | 0 | 5 |
| A 6 | පාළුගහකමත .. .. | 0 | 1 | 14 |
| A 7 | කුකුල්කටුව මිනිපිච්චනිය (මිනිපිච්චනිය) | 0 | 1 | 31 |
| A 8 | පාර (මිනිපිච්චනියට යන පාර) .. | 0 | 0 | 20 |
| A 9 | වෑකන්දේබිම (වැවට සහ කන්ඩියට අත් ඇර තිබෙන බිම්කට්ටිය) .. | 3 | 2 | 21 |
| A 10 | කෝන්ගහලදවිතන .. .. | 0 | 0 | 12 |
| A 11 | කුකුල්කටුවගන්ගොට .. | 5 | 1 | 16 |
| A 12 | තිස්බඹ .. .. | 2 | 2 | 4 |
| | කදුරුපිටියගම. | | | |
| B 13 | කදුරුපිටියමහවෙල .. .. | 18 | 0 | 10 |
| B 14 | එම .. .. | 0 | 0 | 10 |
| B 15 | එම .. .. | 0 | 0 | 10 |
| B 16 | වැලිඇල (ඇල) .. .. | 0 | 1 | 1 |
| B 17 | කදුරුපිටියේමහවෙල .. .. | 0 | 0 | 10 |
| B 18 | වෑකන්දේබිම (වැවට සහ කන්ඩියට අත් ඇර තිබෙන බිම්කට්ටිය) .. | 4 | 2 | 12 |
| | වීරසෝලේගම. | | | |
| C 19 | මිනිපිටියලන්ද .. .. | 0 | 1 | 33 |
| C 20 | මිනිපිටියපාර .. .. | 0 | 0 | 10 |
| C 21 | වෑකන්දේබිම .. .. | 3 | 1 | 30 |
| C 22 | හොරෙව්ඇල .. .. | 0 | 0 | 23 |
| C 23 | තිස්බඹ .. .. | 0 | 3 | 3 |
| C 24 | ගන්ගොඩ .. .. | 0 | 3 | 25 |
| C 25 | ඉහලඅක්කරවෙල (213,118 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම) .. | 4 | 3 | 5 |
| C 26 | හොරෙව්ඇල .. .. | 0 | 0 | 4 |
| C 27 | එම .. .. | 0 | 0 | 9 |
| C 28 | එම .. .. | 0 | 0 | 4 |
| C 29 | මහවෙල .. .. | 13 | 2 | 38 |
| C 30 | පහලඅක්කරවෙල (237,715 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම) .. | 4 | 3 | 8 |
| | ඇලපත්ගම. | | | |
| D 31 | වෑකන්දේබිම (වැවට සහ කන්ඩියට අත් ඇර තිබෙන බිම්කට්ටිය) .. | 3 | 1 | 1 |
| D 32 | අඩිපාර .. .. | 0 | 0 | 22 |
| D 33 | ඇල .. .. | 0 | 0 | 33 |
| D 34 | මුල්පොතවෙල .. .. | 3 | 3 | 10 |
| | සූරියදමනගම. | | | |
| E 35 | තල්ගහකුඹුර .. .. | 0 | 1 | 21 |
| E 36 | ඇල .. .. | 0 | 0 | 8 |
| E 37 | තල්ගහකුඹුර .. .. | 0 | 0 | 25 |
| E 38 | ඇල .. .. | 0 | 0 | 21 |

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 225වෙනි පිටේ ප්ලෑනය බලනු.

| බිම්කට්ටිය. | ඉඩමේනම. | බිම්තරම, අ. රූ. ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| E 39 | තල්ගහකුඹුර .. | .. 0 1 17 | E 43 | තල්ගහකුඹුරහේන .. | .. 0 0 9 |
| E 40 | තල්ගහකුඹුර නොහොත් අක්කරඉඩම (217,705 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම) .. | .. 21 0 38 | E 44 | ගන්ගොඩ .. | .. 1 2 21 |
| E 41 | වැකන්දේබිම (වැවට සහ කන්ඩියට අත් ඇර තිබෙන බිම්කට්ටිය) | .. 3 1 7 | E 45 | මිහිපිටිය .. | .. 0 0 35 |
| E 42 | තිස්බඹ .. | .. 0 1 34 | E 46 | පාර (මිහිපිට්ටනියට යන පාර) | .. 0 0 10 |
| | | | | | 139 3 24 |

[අනුරාධපුර වි. ම. 47—1917.]

---

[අනුරාධපුර දැන්වීම නො. 6,600.]

වම් 1917ක්වූ ඔක්තෝබර් මස 5වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙනයම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වම් 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන් නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ටී. ජී. විලට් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපූ එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැරදක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙසින් දැනගත යුතුයි.

ටී. ජී. විලට්,
විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

ඉඩම්වල තොරතුරු.

උතුරු මධ්‍යම දිසාවේ නුවරගම් පලාතේ විලච්චියකෝරලේ විලච්චිය තුලානේ මහඅන්දරදිගිලිය යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

I.—ටොපෝ මුල් සිතියම 7.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 47 .. | මහඅන්දරදිගිලියකැලේ (කැලෑ, වැව්, දියපාරවල්, පාරවල්) .. | .. 2,199 3 2 |

මීට මායිම්—උතුරට මහනිකඇලද ; නැගෙණහිරට අරිප්පු සිට අනුරාධපුරයට යන පාරද, අරිප්පු සිට පුත්තලමට යන පාරද ; දකුණට සහ බස්නාහිරට තලාවේඹයද.

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටි මේ දැන්වීමෙන් මේ කොටසෙන් අත්හැරියමගත් ඒවායේ මුලු බිම්තරම වන අක්කර 13කුත් රූඩ් 3කුත් පර්චස් 38ට ඉහතකී අක්කර 2,199කුත් රූඩ්ස් 3කුත් පර්චස් 2කේ බිම්තරමේ අඩංගු නොවන වගත් මෙසින් දැනගත යුතුයි.

ටොපෝ මුල් සිතියම 7.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| A 48 | අන්දරදිගිලිකැලේ (වැව්කන්ඩියට ඉතුරු කර තිබෙන බිම්කට්ටිය) | .. 2 3 7 | A 51 | අඹගහවත්ත .. | .. 0 2 28 |
| A 49 | මහඅන්දරදිගිලියවෙල | .. 6 0 18 | A 52 | දික්වැව්වෙල .. | .. 2 3 31 |
| A 50 | අන්දරදිගිලියකැලේ .. | .. 1 2 4 | | | |
| | | | | | 13 3 38 |

II.—ටොපෝ මුල් සිතියම 7.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 48 .. | අන්දරදිගිලියකැලේ (වැව්කන්ඩියට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය) | .. 2 3 7 |
| 50 .. | එම .. .. .. | .. 1 2 4 |
| | | 4 1 11 |

මීට මායිම්—උතුරට සහ නැගෙණහිරට රජසන්තක වැව්කන්ඩියද ; දකුණට රජසන්තක මහඅන්දරදිගිලියකැලේද ; බස්නාහිරට රජසන්තක මහඅන්දරදිගිලියකැලේද, දිසානායක හේරත්බන්ඩා විසින් අයිතිකම්කියන දික්වැව්වෙලද, දිසානායක හේරත්බන්ඩා විසින් අයිතිකම්කියන අඹගහවත්තද, දිසානායක හේරත්බන්ඩා විසින් අයිතිකම්කියන මහඅන්දර දිගිලියවෙලද, රජසන්තක අන්දරදිගිලියකැලේද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 226 වෙනි පිටේ ප්ලෑනය බලනු.

[අනුරාධපුර වි. ම. 48—1917.]

---

[ඌව දැන්වීම නො. 6,601.]

වම් 1917ක්වූ ඔක්තෝබර් මස 5වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වම් 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත්. එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපූ එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරන බව මෙසින් දැනගත යුතුයි.

ජේ. ඇම්. ඩේවිස්,
විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

ඉඩම්වල තොරතුරු.

ඌව දිසාවේ යටිකිඳ කොට්ඨාසයේ රිල්පොලකෝරලේ මැදගම යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

I.—මුල් සිතියම 13.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 2H1 .. | හන්සභාපාර .. | .. 0 0 10 | 8C .. | හන්සභාපාර .. | .. 0 0 7 |
| 2I1 .. | එම .. | .. 0 0 4 | 16I1 .. | එම .. | .. 0 0 5 |
| 3A .. | එම .. | .. 0 0 16 | | | |
| 7A .. | එම .. | .. 0 0 7 | | | 0 1 15 |
| 8B .. | එම .. | .. 0 0 6 | | | |

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 227—228වෙනි පිටුවල ප්ලෑන් බලනු.

මීට මායිම්—උතුරට බෝකොටුවේවත්තේ උක්කුබන්ඩා විසින් අයිතිකම්කියන බෝකොටුවේවත්තේහේනද; නැගෙණහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන ගම්සභාපාරද, හුරියගස්වත්තේගෙදර උක්කුබන්ඩා විසින් අයිතිකම්කියන බෝකොටුවේවත්තේහේනද, දියපාර, පුංචිමැනිකා සහ තවත් අයවර්න් විසින් අයිතිකම්කියන උඩහේනවත්තද, ඇලේකෙහෙල්කඩුරද, අලුත්ගෙදර සියාතු සහ තවත් අයවලුන් විසින් අයිතිකම්කියන බෝගහවතුයායද, අලුත්ගෙදර සියාතු සහ තවත් අයවලුන් විසින් අයිතිකම්කියන ඇහැලගහඅරවද, අලුත්ගෙදර සියාතු සහ තවත් අයවලුන් විසින් අයිතිකම්කියන බෝගහවතුයායද, අපිටගෙදර පන්සල්වත්තේ අප්පුහාමි සහ තවත් අයවලුන් විසින් අයිතිකම්කියන පට්ටියාවත්තේහේනද; දකුණට කෝන්ගහකඩුරද; බස්නාහිරට අපිටගෙදර පන්සල්වත්තේ අප්පුහාමි විසින් අයිතිකම්කියන පට්ටියාවත්තේහේනද, අලුත්ගෙදර සියාතු සහ තවත් අයවලුන් විසින් අයිතිකම්කියන බෝගහවතුයායද, අලුත්ගෙදර සියාතු සහ තවත් අයවලුන් විසින් අයිතිකම්කියන ඇහැලගහඅරවද, අලුත්ගෙදර සියාතු සහ තවත් අයවලුන් විසින් අයිතිකම්කියන බෝගහවතුයායද, ඇටකෙහෙල්කඩුර, පුංචිමැනිකා සහ තවත් අයවලුන් විසින් අයිතිකම්කියන උඩහේනවත්තද, හුරියගස්වත්තේගෙදර උක්කුබන්ඩා විසින් අයිතිකම්කියන බෝකොටුවේවත්තේහේනද.

II.—මුල් සිතියම 13.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 19A | ගම්සභාපාර | 0 0 36 |

මීට මායිම්—උතුරට ජී. කිරිවන්තා විසින් අයිතිකම්කියන ගොඩවතුයායද; නැගෙණහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන ගන්සභාපාරද; දකුණට ජී. කිරිවන්තා සහ තවත් අයෙකුත් විසින් අයිතිකම්කියන ගොඩවතුයායද, ගන්සභාපාරද, ජී. කිරිවන්තා සහ තවත් අයෙකුත් විසින් අයිතිකම්කියන ගොඩවතුයායද; බස්නාහිරට කෝන්ගහකඩුරද.

III.—මුල් සිතියම 13.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 2J | ගලමුදුනේපතන | 4 0 38 |
| 2J1 | ගන්සභාපාර | 0 0 17 |
| | | 4 1 15 |

මීට මායිම්—උතුරට වැලිවත්ත ගමේ ගම්ඉමද; නැගෙණහිරට කොටවත්තේගෙදර හුදුහාමි සහ තවත් අයවලුන් විසින් අයිතිකම්කියන හෙනගේඇල්ලේඅරවේකුඹුරුයායද; දකුණට දියපාරක්ද; බස්නාහිරට හුරියගස්වත්තේගෙදර උක්කුබන්ඩා විසින් අයිතිකම්කියන බෝකටුවේවත්තේහේනද, ආණ්ඩුව විසින් අයිතිකම්කියන ගන්සභාපාරද, බෝකටුවත්තේ උක්කුබන්ඩා විසින් අයිතිකම්කියන බෝකටුවේවත්තේහේනද, ආණ්ඩුව විසින් අයිතිකම්කියන පුස්හෙරලිගහවත්තද (324,747 පිඹුරුකරඳුසියේ පෙණෙන ඉඩම).

IV.—මුල් සිතියම 13.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 26 | දියනිල්දෙණුවෙපතන | 3 3 34 |

මීට මායිම්—උතුරට පාරක්ද; නැගෙණහිරට 178,069 පිඹුරුකඩදාසියේ පෙණෙන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපු දියනිල්දෙණුව; දකුණට කොහිලාගොල්ලෙකඩුර; බස්නාහිරට දියවකනගොඩගෙදර හීන්බන්ඩා විසින් අයිතිකම්කියන පන්සලවත්ත.

[ඌව වි. ම. 33—1917.]

---

[ඌව දැන්වීම නො. 6,602.]

වර්ෂ 1917ක්වූ ඔක්තෝබර් මස 5වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900යේ සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ඇම්. ඩේවිස්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

ඌව දිසාවේ උඩුකිඳ කොට්ඨාසයේ උඩපලාත කෝරලේ කලාබුල්ලන්ද යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන 186 මුල් සිතියමේ 25S පෙනෙන පර්චස් 12ක් බිම්තරම ඇති සාමාන්‍යවසයෙන් අඩිපාර කියන නොහොත් ඒනමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට විල්සන් බංගලාවට යන අඩිපාරද; නැගෙණහිරට අලවලුගොඩ අගලපස්සේගෙදර බද්දේරල විසින් අයිතිකම්කියන අගලපස්සේවත්ත සහ කපුවත්තද, කිරිවානාගම පුංචිරල විසින් අයිතිකම්කියන දිඹුලගාවවත්තද, ආණ්ඩුව විසින් විකුණනලද හතේවත්තද, (307,959 පිඹුරුකඩදාසියේ පෙනෙනා ඉඩමද), කලබුල්ලන්දේගෙදර පුංචිරල විසින් අයිතිකම්කියන දික්වත්තද, කලබුල්ලන්දේ කිරිවන්තෙ විසින් අයිතිකම්කියන ගෙදරවත්තද; දකුණට කලුබුල්ලන්දේගෙදර පුංචිරල විසින් අයිතිකම්කියන දික්වත්තද; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුණනලද හතේවත්තද, (307,959 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමද), ආණ්ඩුව විසින් විකුණනලද ඉලුක්වත්තද, (316,902 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමද).

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 228වෙනි පිටේ ප්ලෑනය බලනු.

[ඌව වි. ම. 34—1917.]

---

[ඌව දැන්වීම නො. 6,603.]

වර්ෂ 1917ක්වූ ඔක්තෝබර් මස 5වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900යේ සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරන බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ඇම්. ඩේවිස්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

ඌව දිසාවේ බුත්තල කොට්ඨාසේ කඳුකරකෝරලේ අමුනුමුල්ල යන ගම පිහිටාතිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන 217 මුල් සිතියමේ 28½ පෙණෙන රූඩ් 3කුත් පර්චස් 22ක් බිම්තරම ඇති ඉඩමෙන් ගලායන කුඹුරුවලට වතුරගෑනීම පිණිස කපා තිබෙන ඇල අත්හැර සාමාන්‍යවසයෙන් පුවක්ගොල්ලේහේන (ඇලට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය) කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට මැදකඩුරද; නැගෙණහිරට මැදකඩුරද, (313,669 පිඹුරුකඩදාසියේ පෙණෙන ඉඩමද), ඒ. අප්පුහාමි සහ තවත් අයවළුන් විසින් අයිතිකම්කියන පුවක්ගොල්ලේහේන; දකුණට (242,102 පිඹුරුකඩදාසියේ පෙණෙන ඉඩම); බස්නාහිරට පස්සරකෝරලේ මායිමද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 229වෙනි පිටේ ප්ලෑනය බලනු.

[ඌව වි. ම. 35—1917.]

[මාතලේ දැන්වීම නො. 6,604.]

**වර්ෂ 1897තේ 1899යේ සහ 1900යේ සහ 1903න් මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.**

මෙහි පහත සඳහන්වෙන ඉඩම සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්ෂ 1917ක්වූ ඔක්තෝබර් මස 5වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කේ මාතලේ කච්චේරියට ඇවිත් උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙණීසිට එකී ඉඩමට තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම කටින් හෝ ලියමනකින් කියා නොසිටියොත් එකී උප ඒජන්ත උන්නාන්සේ විසින් එකී ආඥාපණත්වලින් උන්නාන්සේට ලැබී තිබෙන බලපුළුවන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම රජසන්තක ඉඩමක් බව උන්නාන්සේගේ අත් සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

**කියන්නේ මේ ඉඩම ගැණයි.**

මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කේ මාතලේ නැගෙණහිර පලාතේ අඹන්ගගකෝරලේ සිරන්ගහවත්ත යන ගමේ පිහිටා තිබෙන මයිපොලගාවාමූකලාන (උල්පත්වලට ඉතුරුකර තිබෙන හරිය) කියා ව්‍යවහාරකරණ අක්කර 6කුත් රූඩ් 1කුත් පර්චස් 20ක් විසාල ඇති නොම්මර 6,757තේ මුල් සිතියමේ ජේන නොම්මර 1කේ මීට යාකර තිබෙන සිතියමේ* ජේන ඉඩමය, ඊට මායිම්—උතුරට නො. 141,758ට දරණ පිඹුරුකඩදාසියේ ජේන ඉඩමද; නැගෙණහිරට අඹුනුගම සිට දන්කන්දට යන ගම්සහා පාරද; දකුණට සහ බස්නාහිරටත් ආණ්ඩුව විසින් අයිතිවාසිකම් නොකියන මයිපොලගාවාමූකලානද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 229 වෙනි පිටේ ප්ලෑනය බලනු.

---

**උපාඩගනීති.**

1898වේ ලෝකල් බෝඩ් සහා ආඥාපණත.

මඩකලපුවේ ලෝකල් බෝඩ් සහාව විසින් සාදනුලැබ 1913 දෙසැම්බ මස 19වෙනි දින දරණ ආණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රසිඩකරණු ලැබුවාවූ අතුරුපණත් වෙනුවට 1898වේ අංක 13 දරණ ආඥාවේ 56 (5) වෙනි වගන්තිය යටතේ ඉහතකී සහාව විසින් සාදනු ලැබුවාවූද ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කාරක මනත්‍රණ සහාවේ මනත්‍රණ පිට ස්ථිරකරණු ලැබුවාවූද මෙහි පහත දක්වන අතුරුපණත් මහජනයාගේ දැනගැණීම පිණිස මෙහි ප්‍රසිඩකරණු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

1917ක්වූ සැප්තැම්බ මස 4වෙනි දින කොළඹ මහසෙක්‍රතාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහසෙක්‍රතාරිස් වම්හ.

එකී අතුරුපණත්.—පාන්ගෙවල්.

1. පාන්ගෙය යන්නෙහි අදහස නම් මිනිසුන්ගේ කෑමට විකුණනුලනබ පාන් හෝ විස්කෝතු හෝ සීනිකෑම පුළුස්සන පිණිස පාවිච්චිකරණ ගේදොරක්ය. තවද එබඳු කෑම පුළුස්සන පිණිස කෑමජාති සූදානම්කරණ ගේදොරක් හෝ එබඳු කෑම සෑදීම පිණිස පාවිච්චිකරණු ලබන බඩු බාහිරාදිය තබාතිබෙන ගේදොරක් හෝ ඊට ඇතුළත්වේ.

2. සහාවේ ප්‍රධානතුමාගෙන් අවුරුදුපතා අවසරපත්‍රයක් නොලබන කිසිවෙකු විසින් පාන්ගෙයක් තබාගැණීම තහනම්ය. ලබාගන්නාලද එබඳු සියලුම අවසරපත්‍ර එම අවුරුද්දේ දෙසැම්බ මස 31වෙනි දින වනතුරු නොහොත් එම අවසරපත්‍ර අවලංගුකරණතුරුම වලංගුව තිබිය යුතුයි. මෙහි පෙණෙන නියෝග ප්‍රකාර ක්‍රියානොකරණ කිසිවෙකුට එබඳු අවසරපත්‍රයක් නොදීමට ප්‍රධානතුමාට බලය පවරා තිබේ. මනත්‍රණ සහාවේ මනත්‍රණ පිට ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අනුමතිය ඇතුව ලෝකල්බෝඩ් සහාව විසින් කලින්කලට නියමකරණු ලබන ඒ ඒ ගාස්තු එබඳු අවසරපත්‍රවලට ගෙවියයුතුයි.

3. මෙහි පෙණෙන නියෝග කඩකිරීම ගැණ යමෙක් යම් උසාවියකදී එක වාරයක් හෝ ඊට වැඩි වාර ගණනක් වැරදිකාරයා උනිනම් දෙවෙනිවරට නොහොත් ඊට පසු වන්නාවූ නඩුව ලියාතබන උසාවියට මෙම වගන්තියේ ප්‍රකාර ලෝකල් බෝඩ් සහාවේ ප්‍රධානතුමා විසින් එවැනි අයට නිකුත්කරණලද අවසරපත්‍රය අවලංගුකිරීමට බලයතිබේ. උසාවියක් විසින් අවසරපත්‍රයක් එයාකාර අවලංගුකළවිට එබඳු අයට නැවත අලුතෙන් අවසරපත්‍රයක් නිකුත්කිරීම ලෝකල් බෝඩ් සහාවේ ප්‍රධානතුමාට කල්පනාවන පරිදි තහනම්කිරීමට බලය පවරා තිබේ.

4. පිටිඇනීම කරණ කාමරයේ මතුපිට බිම්තරම ඉතා අඩු වශයෙන් අඩි 12×15ක් වියයුතුයි. හරහට වාතය නැමීමට ඉඩලැබෙන පිණිස අඩි හතකට අඩුනුවූ බිම්ප්‍රමාණයක් ඉතා අඩු වශයෙන් දෙපැත්තේවත් තිබිය යුතුයි. පෝර්ණුවේ දොර පිටි අනන කාමරයට කෙලින්ම තිබියයුතු නොවේ. පිටි ඇනීම කරණ සෑම කාමරවලම සීලිං නම් වියන්තට්ටුවක් උඩට තිබිය යුතුයි.

5. සෑම පාන්ගේවලට හොඳකාර වාතයද ආලෝකයද තිබිය යුතුයි. සෑමතැනම භිත්ති උසින් අඩි 7කට අඩු නොවෙන්ට ගඩොලින් හෝ ගලින් හෝ කබුක්ගලින් සාදා ඒවායේ ඇතුල් පැත්ත හුණෙන් කපරාරුකොට හමාසයකට වරක් සුදුහුණු ගෑම කළයුතුයි. වහල කලක් පවතින ද්‍රව්‍යයකින් තැනූ එකක් වියයුතුයි. සීලිංනම් වියන්තට්ටු කපරාරුකොට අවුරුද්දකට හතරවතාවක් සුදුහුණු ගෑම කළයුතුයි, නොහොත් ඒවා හොඳකාර පුච්චුවන ලෑලිවලින් සාදා වාර්නිස් හෝ සායම් තීන්තගා තැබිය යුතුයි. මුළු බිම සිමෙන්ති දමා සෑහෙන තරම් ජල බස්නාව ඇතුව සාදා තිබිය යුතුයි. අරින හැකිවූද මතුපිට බිම්තරමෙන් $\frac{1}{16}$ක් ප්‍රමාණය ඇතිවූද කවුළු සෑම කාමරවලටම තිබිය යුතුයි.

6. පාන් සෑදීමට සහ පිටි ඇනීමට පාවිච්චිකරණ සියලුම භාජන සහ බඩුබාහිරාදිය සම්පූර්ණයෙන්ම පිරිසිදුව තබාගත යුතුයි. තවද ගෙබිම පිරිසිදුකිරීමේදී ඒවා අහක්කරන්ට හැකිවද තිබිය යුතුයි.

7. ඉතා අඩු වශයෙන් විසිහතර පැයකට වරක්වත් ගෙබිම ප්‍රවේසමෙන් සූරා අතුගා කුණුකසල එවෙලේම පියනකින් යුත් සිදුරු නොමැති භාජනයක බහා දිනපතා පාන්ගෙයින් අහක්කළ යුතුයි.

8. කාණු වැසිකිළි වතුරවළ යන මෙයින් හෝ වෙන යම් අපිරිසිදු දෙයකින් නික්මෙන දුගීන්ධයෙන් සියලුම පාන්ගෙවල් නිදහස්කොට පිරිසිදුව තැබිය යුතුයි.

9. කිසිම පාන්ගෙයක් කක්කුස්සියකින් හෝ පොහොරගොඩකින් හෝ නොවසනලද කාණුවකින් හෝ වැසිකිළියකින් හෝ අඩි පණහක් ඇතුළත නොතිබිය යුතුයි.

10. පාන්ගෙය තුළ පාන් සෑදීමට සහ පිටි ඇනීමට පාවිච්චිකරණ බඩුබාහිරාදිය හැර ලීබඩු හෝ වෙන යම් දෙයක් තැබීම තහනම්ය.

11. මේස මතුපිට හොඳකාර පුච්චුවන තෙත්ගතිය නැති ලෑලිවලින් හෝ අනතුරු රහිතවූද සිදුරුනොවන්නාවූද වෙන යම් ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුයි. තවද ඒවා දිනපතා සූරා ශුඩකළ යුතුයි.

12. කිසිම කරුණක් සඳහාවත් තිරිසනුන් පාන්ගෙය තුළ නැවැත්වීම තහනම්ය.

13. සපශී හේතුවෙන් හෝ ආඝ්වාස හේතුවෙන් හෝ බෝවෙන රෝගයකින් පෙළෙන කිසිවෙකුට නොහොත් පාන්ගෙය බාරකාරයාගේ දැනුම්පිට එවැනි රෝගයක් අලුතදී වැළඳ සිටිය කිසිවෙකුට නොහොත් එවැනි රෝගයක් තිබුණ කෙනෙකුට අලුතදී සාත්තුකළ කිසිවෙකුට පාන්ගෙට ඇතුල්වීමට හෝ පාන් විස්කෝතු සීනිකෑම සෑදීමට හෝ ඒ ස්ථානයේදී විකිණීමට පාන්ගෙය භාරකාරයා විසින් ඉඩදිය යුතු නොවේ.

14. පාන් සෑදීමෙහි සහ පිළිස්සීමෙහි යෙදී සිටින සියලුදෙනා විසින්ම තමන්ගේ වැඩ පටන්ගන්ට මත්තෙන් අත් සෝදාගත යුතුවා පමණකුත් නොව පපුව සහ ශරීරයේ ඉස්සරහපැත්ත වැහෙන්නාවූ පිරිසිදු සුදු ආවරණයක්ද කැප් තොප්පියක් හෝ සුදු තලප්පාවක් පැළඳගත යුතුසි.

15. පාන් විස්කෝතු සීනිකෑම සෑදීමෙහි යෙදී සිටින්නන්ගේ ප්‍රයෝජනය පිණිස ශුබජලය සහ සබන් සපයා තැබිය යුතුසි.

16. විකිණීමට තිබෙන සියලුම පාන් විස්කෝතු සීනිකෑම කැවිලිජති මැස්සන්ට ඇතුල්විය නොහැකි නිසියාකාර තනනලද වීදුරු පෙට්ටිවල තබා තිබිය යුතුවා පමණකුත් නොව එම පෙට්ටි සම්පූර්ණයෙන්ම පිරිසිදුව තබාගත යුතුසි.

17. පාන් සෑදීමට පාවිච්චිකරණ පිටි වතුර සහ අනිකුත් ද්‍රව්‍ය හොඳ ඒවා විය යුතුවා පමණකුත් නොව සනීපය ගෙණදෙන ඒවාද වියයුතුසි. තවද බිම සිට අඩි තුණක් උසට තනනලද මැස්සක් පිට පිටි තබා තිබිය යුතුසි.

18. පාන්ගේදෙර අවට තිබෙන සියලුම කුණු කසල දිනපතා අහක්කොට කාණුවලට හොඳකාර වතුර ගසා හැරිය යුතුසි.

19. පාන්ගෙය සම්පූර්ණයෙන්ම වෙන්වෙනු පිණිස බිම සිට සීලිංනම් වියන්තට්ටුව දක්වා ආවරණයක් තිබේනම් මිස එසේ නැත්නම් පාන්ගෙයි මට්ටමට ඇතිවූද එම ගොඩනැගිල්ලෙන් කොටසක්වූද ස්ථානයක් නිදාගැනීම පිණිස පාවිච්චිකළ යුතුනොවේ. මූත්‍රාකිරීමට පාවිච්චිකරණ කාමරයක් හෝ මල ශුබකිරීමට පාවිච්චිකරණ කාමරයක් හෝ වැසිකිළියක් හෝ අලුවළක් පාන්ගෙය ඇතුළත හෝ කෙළින්ම ඊට සම්බන්ධව හෝ තිබියයුතු නොවේ.

20. ලෝකල්බෝඩ් සභාවේ පරීක්ෂක කෙනෙකුට හෝ ප්‍රධානතුමාගෙන් ලියවිල්ලකින් බලය ලබා සිටින අන්කිසි මූලාදූනියෙකුට හෝ සෑම සුදුසු ප්‍රස්ථාවලදී සහ පාන් සෑදීමේ කටයුතුකරණ කොයියම් වෙලාවක හෝ පාන් ගෙයක් නොහොත් පාන් විකිණීම පිණිස පාවිච්චිකරණ ස්ථානයක් ඇතුළට ගොස් පරීක්ෂාකිරීමට බලය තිබේ.

21. සියලුම පාන්ගේවල මේ අතුරුපණත්වලින් පිටපතක් රාමුවක දමා කාටත් පෙණියහැකි ස්ථානයක එල්ලා තැබිය යුතුසි.

22. ප්‍රධාන තුමාගෙන් ලියවිල්ලකින් බලය ලබා සිටින පරීක්ෂක කෙනෙකුට ආණ්ඩුවේ වෛද්‍යාචාර්‍යතැනගේ සෝදිසිය පිණිස පාන්වල නොහොත් පාන් සෑදීමට පාවිච්චිකරණ ද්‍රව්‍යවල සැම්පල් ගැණීමට බලය තිබේ.

---

මෙයින් දැනුම්දෙන්නේනම් 1917තේ ඔක්තෝබර් මස 26වෙනි සිකුරාදා සවස 2ට මෙහි පහත සඳහන් ලෝකල්බෝර්ඩ් එකේ 1918ට විකිනියයුතු බදු කච්චේරියේදී අනුරාධපුරේ ලෝකල්බෝඩ් එකේ ප්‍රධානතැන විසින් වෙන්දේසිකරන්ට යෙදෙනවා ඇත.

1. මාර්කට් බද්ද. 2. ගාල්වල බද්ද. 3. තණකොළ බද්ද.

වර්ෂ 1917ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින
අනුරාධපුර ලෝකල්බෝඩ් කන්තෝරුවේදීය.

එච්. ආර්. ප්‍රීමන්,
සෞඛ්‍ය සභාවේ ප්‍රධානතැන.

---

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

බස්නාහිර දිසාවේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1917ක්වූ ඔක්තෝම්බ්‍ර මස 19වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට කොළඹ කච්චේරියේදී, කොළඹ කුරුඳුවත්තේ බදු සිතියමේ පෙනීයන මීට යාකර තිබෙන ලැයිස්තුවේ සඳහන්වෙන ආණ්ඩුවේ ඉඩම්කට්ටියේ තණකොළ සහ කුරුඳු කපා ගැනීමට 1917ක්වූ ඔක්තෝම්බ්‍ර මස 1වෙනි දින පටන් අවුරුද්දක බද්ද ගැනීමට ටැන්ඩර් පත්‍ර මෙහි සඳහන් කරණ කොන්දේසිවලට යටත්ව භාරගනු ලැබේ.

1. වැඩි ඉල්ළුම්කාරයා ගැණුම්කාරයාවේ.

2. ඉඩමේ බදුමිල ගෙවිල්ල මෙසේවේ. එනම්, (a) තුන් මාසයක මුදල විකුණුම් දිනේදීද එතැන් පටන් ඉතුරු මුදල මාසේකට වරක් බැගින්ද, කලින් ගෙවිය යුතුසි.

3. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගහක් කපන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට අවසර නැත.

4. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලබාගත් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩමේ කිසිම කොටසක තණකොළ කැපීමේ බලය යම් කෙනෙකුට පවරන්ටවත් නැවත බදු දෙන්ටවත් ගැණුම්කාරයාට අවසර නැත.

5. බදු ඉඩමේ වැට බඳින්ට ඒජන්ත උන්නාන්සේ විසින් නියමකළොත් එසේ කෙරීමට බදුකාරයා බැඳිලාය.

6. ගැණුම්කාරයා විසින් ඉඩම සුද්දෙන් සහ හොඳකාරයෙන් තිබාගන්ටත් නාගරික සභාවේ අණපණත් හැටියට ක්‍රියාකරන්ටත් ඕනෑය.

7. බදු ඉඩමෙන් බොරළු, වැලි ආදියක් විකුණන්ටවත් ගෙනයන්ටවත් ගැණුම්කාරයාට තහනම්ය. තවද එම ඉඩමට අලාභහානි වෙන කිසි ක්‍රියාවක් කිරීමත් තහනම්ය.

8. මුළු ඉඩම හෝ ඉඩමෙන් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑකළොත් සුමානයක් කල්දුන්විට එවෙනි ඉඩම් කොටස ආණ්ඩුවට බාරදිය යුතුසි. එසේ ආණ්ඩුව විසින් නැවත බාරගන්නා ඉඩම් කොටසට ගතවෙන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගතවෙන්ට තිබෙන කාලයට බදු මුදලින් ආපසු ගෙවන්ට යෙදෙනවා ඇත.

9. බදුකාරයා විසින් ඉම් ඉඩමට ගෙවියයුතු වරිපණම් ගෙවන්ට ඕනෑය.

10. ඉහත සඳහන්වෙන කොන්දේසි කඩකළොත් වන්දි මුදලක් නොගෙවා ගැණුම්කාරයා සහ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් අහක්කර ඉඩමේ නැවත බුත්තියට පැමිණෙන්ට වංශාධිපති ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

11. යම් ඉල්ලීමක් භාරගන්ට හෝ නොගන්ටත් උවමනා උනිනම් බදු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ටත් ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

අත්සන්කළේ, ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1917ක්වූ සැප්තැම්බ්‍ර මස 29වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

---

### 1.—කොළඹ කුරුඳුවත්තේ බදු සිතියමේ ජේන ඉඩමේ ලැයිස්තුවයි.

| ඉඩම. | පිහිටීම. | තත්වය. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 20 | දෙමටගොඩ සහ එගොඩ කොලොන්නාව .. | කුරුඳු සහ තණකොල .. | 84 | 2 | 3 |